# <u>වයඹ පළාත් සභාව</u>

## <u>කොන්ත්‍රාත් පදනමින් කාර්මික නිලධාරීන් (සිවිල්) බඳවා ගැනීම.</u>

වයඹ පළාතේ කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කවල වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුව, වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව හා වයඹ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව යන ආයතනවල ගොඩනැගිලි, වාරිමාර්ග, මාර්ග සහ පළාත් පාලන ආයතන සඳහා ඉදිකිරීම් ව්‍යාපෘතිවල සේවය කිරීම සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් :**

i. NDT (සිවිල්), NDES (සිවිල්), HNDE (සිවිල්), BTEC (සිවිල්) සහ වසර එකක පළපුරුද්ද හෝ NCT (සිවිල්) සහ වසර තුනක පළපුරුද්දක් තිබිය යුතුය.

ii ගොඩනැගිලි, වාරිමාර්ග සහ මාර්ග ඇස්තමේන්තු කිරීම සහ අධීක්ෂණය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

iii. මනා පරිගණක සාක්ෂරතාවයක් තිබිය යුතුය.

iv. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 - 45 ත් අතර විය යුතුය.

හෝ

v. රජයේ හෝ රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක සේවය කර විශ්‍රාම ලබා ඇති වයස අවුරුදු 67 නොඉක්ම වූ අයදුම්කරුවන්

**02. සේවයේ යෙදවීමේ කොන්දේසි :**

i. කොන්ත්‍රාත් කාලය තුළ රජයේ අනුමත චක්‍රලේඛවලට අනුව ආයතනික මට්ටමින් මාසිකව රු. 68,602.00 ක දීමනාවක් ගෙවනු ලැබේ.

ii. විශ්‍රාමික නිලධාරීන්ට නැවත සේවයේ යොදවා ගැනීමේදී ගෙවීම් කරන විධිවිධාන අනුව බඳවාගනු ලබන විශ්‍රාමික නිලධාරීන් සඳහා ගෙවීම් සිදු කෙරේ.

iii. මෙම පත්වීම 2026.12.31 දින දක්වා පමණක් වලංගු වන අතර, තාවකාලික කොන්ත්‍රාත් පදනමක් මත බඳවාගැනීම සිදු කෙරේ.

iv. සේවක අර්ථසාධක අරමුදල (EPF) හා සේවක භාරකාර අරමුදල (ETF) සඳහා දායකත්ව හිමිකම් පවතී.

v. වයඹ පළාතේ ස්ථිර පදිංචිකරුවන් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

**03. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :**

පහත ආකෘතියේ පරිදි අයදුම්කරුවන් විසින්ම සකස් කර ගන්නා ලද අයදුම්පත හා අදාළ අධ්‍යාපනික සහ සේවා පළපුරුද්ද සනාථ කෙරෙන සහතිකවල ඡායාපිටපත් සමඟ 2026.06.24 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **"ප්‍රධාන ලේකම්, වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලය, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"කොන්ත්‍රාත් පදනමින් කාර්මික නිලධාරීන් බඳවා ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.

## කොන්ත්‍රාත් පදනම මත කාර්මික නිලධාරීන් බඳවා ගැනීමේ අයදුම්පත්‍රය

1. මුල් අකුරු සමඟ නම : ..........................................................
2. මුල් අකුරු වලින් හැඳින්වෙන නම් : ..........................................................
3. උපන් දිනය : ..........................................................
4. ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................
5. 2026.06.24 දිනට වයස : අවු.................. මාස .............. දින ...............
6. ස්ථිර ලිපිනය : ..........................................................
   : ..........................................................
7. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : ..........................................................
8. විවාහක / අවිවාහක බව : ..........................................................
10. දුරකථන අංකය ජංගම : ..........................................................
    ස්ථාවර : ..........................................................
    WhatsApp : ..........................................................
11. විද්‍යුත් තැපැල් ලිපිනය : ..........................................................
12. අධ්‍යාපන සුදුසුකම් : ..........................................................
13. වෘත්තීය සුදුසුකම් : ..........................................................
14. සේවා පළපුරුද්ද : ..........................................................
15. නිවේදනයේ සඳහන් පරිදි ඉල්ලුම් කරනු ලබන දෙපාර්තමේන්තු ප්‍රමුඛතා අනුපිළිවෙලින්

    1. ..........................................................
    2. ..........................................................
    3. ..........................................................

ඉහත සඳහන් සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

................................ ................................

අයදුම්කරුගේ අත්සන දිනය